# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පළාත් පාලන දෙපාර්තමේන්තුව, උතුරු පළාත

## චාවකච්චේරි නගර සභාව, චාවකච්චේරි

## ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය මුදලින් කොටසක් පහත වගුවේ සඳහන් කර්මාන්ත සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සිදුකිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

02. චාවකච්චේරියේ චාවකච්චේරි නගර සභාව වෙනුවෙන් පළාත් පාලන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ ලැයිස්තුගත කොට ඇති කර්මාන්තය සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

| අංකය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්තුවේ නම | යෝජක ගේ ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන | CIDA ශ්‍රේණිය සහ විශේෂතාවය | කොන්ත්‍රාත් කාලය (දින) | ලංසු ඇපකරයේ වටිනාකම | ලංසු වලංගු කාල සීමාව | ලංසු ඇපකරයේ වලංගු කාලය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | LDSP/NP/ JAF/CUC/ BT4/2024/01 | චාවකච්චේරි නගරයේ සාප්පු ඒකක ඉදිකිරීම අදියර II | 12.47 | C6 හෝ ඉහළ ගොඩනැගිලි ඉදිකරීම් | 90 | 125,000.00 | 2024 මැයි 07 දින දක්වා | 2024 ජූනි 04 දින දක්වා |

03. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ඉහත වගුවේ සඳහන් ශ්‍රේණියේ හෝ ඉහළ ශ්‍රේණියක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වලංගු CIDA ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, ව්‍යාපාර හෝ සමාගම් ලියාපදිංචියද සතු විය යුතුය.

05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවන් සුදුසුකම් තොරතුරුවල 4 වන කොටසේ හා ලංසු ලිපිලේඛනයේ උපලේඛනයේ 5 වන කොටසේ ලංසු දත්ත හා කොන්ත්‍රාත් දත්ත ලබාදී ඇත.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු චාවකච්චේරියේ චාවකච්චේරි නගර සභාවේ ලේකම් වෙතින් (දුරකථනය : 0212270806, ෆැක්ස් : 0212270079) ලබාගත හැකි අතර, 2024 ජනවාරි 22 වෙනි දින සිට 2024 පෙබරවාරි 19 වෙනි දින දක්වා 09.00 පැය හා 15.00 පැය අතර චාවකච්චේරියේ චාවකච්චේරි නගර සභාව යන ලිපිනයේ දී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

07. ආපසු ගෙවනු නොලබන රු. 4,000.00 ක ගාස්තුවක් 2024 ජනවාරි 22 වෙනි දින සිට 2024 පෙබරවාරි 19 වෙනි දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනයන්හි 9.00 පැය හා 15.00 පැය අතර චාවකච්චේරියේ චාවකච්චේරි නගර සභාවේ ලේකම් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.

08. මුල්පිටපත හා අනු පිටපත ලෙස ලංසු, 2024 පෙබරවාරි 20 වෙනි දින 10.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, පළාත් පාලන ප්‍රසම්පාදන කමිටුව, ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP), චාවකච්චේරි නගර සභාව, චාවකච්චේරිය, යාපනය යන ලිපිනය වෙත ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන්වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

09. සියලුම ලංසු සමග ඉහත වගුවේ සඳහන් ආකාරයේ ලංසු ඇපකෙරයක් අමුණා එවිය යුතුය.

10. පූර්ව ලංසු රැස්වීමක් 2024 පෙබරවාරි 12 වෙනි දින 10.00 පැයේදී චාවකච්චේරි නගර සභා සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් තමන්ගේ වියදමින් මෙම රැස්වීමට සහභාගී විය හැකිය.

**සභාපති,**
**පළාත් පාලන ප්‍රසම්පාදන කමිටුව (LAPC),**
**ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)**
**චාවකච්චේරි නගර සභාව, චාවකච්චේරිය.**
**2024 ජනවාරි 22 දින**